භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
Department of Treasury Operations

මහ භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, තැ. පෙ. 1559, කොළඹ 01.
பொதுத் திறைசேரி, நிதி அமைச்சு, த.பெ. இல. 1559, கொழும்பு 01.
General Treasury, Ministry of Finance, P. O. Box 1559, Colombo 01.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 2484729, laliths@sad.gov.lk
ෆැක්ස් / தொலைநகல் / Fax: 94 11-2320042, 94 11-2484828
පොදු / பொது / General: 2484500, 2484600

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | TO/REV/M2/7/2005 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 18 .01.2006 |

භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක: 01/2006

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

## <u>2005 වර්ෂය සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම</u>

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛ අංක 01/2002 හා 01/2002 (1) වෙත ඔබගේ අවධානය යොමු කරමි.

02. ආදායම් පිළිබඳ ගණන් දීමේ නිලධාරීන් විසින් තම වගකීම යටතේ පවතින ආදායම් සංකේතාංක වලට අදාළව හය මසකට වරක් හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ගණන් දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරන ආදායම් සංකේතාංක යටතේ එකතු කරන ආදායම් පිළිබඳව හය මසකට වරක් ඉදිරිපත් කරනු ලබන තොරතුරු ඒකාබද්ධ කිරීමෙන් හිඟ ආදායම් වාර්තා සකස්කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.

03. එබැවින්, පහත දැක්වෙන ආදායම් සංකේතාංක සඳහා 2005.06.30 සිට 2005.12.31 න් අවසන් 06 මාසය සඳහා හිඟ ආදායම් වාර්තා ඉහත සඳහන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛ අංක 01/2002 හි දක්වා ඇති ආකෘති පත්‍ර අංක 3 (ඇමුණුම 1) අනුව සකස් කර 2006.01.31 දිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් ඔබ වෙත දන්වා සිටිනු ලැබේ. අදාළ දිනට හිඟ ආදායම් කිසිවක් නොමැති නම් කරුණාකර හිස් වාර්තාවක් ඉදිරිපත් කරන්න.

| ආදායම් ශීර්ෂ සංකේතාංකය | විස්තරය |
|---|---|
| 20.02.10.01 | රජයේ වත්තවලින් ලැබෙන ආදායම - රජයේ ගොඩනැගිලි කුලී |
| 20.02.10.09 | රජයේ වත්තවලින් ලැබෙන ආදායම - අනෙකුත් කල් බදු කුලී |
| 20.02.20.01 | පොලිය - ණයදීම් |
| 20.02.20.02 | පොලිය - වෙනත් |
| 20.03.10.00 | විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම් |
| 20.03.20.99 | විකුණුම් හා ගාස්තු - විවිධ |

අධ්‍යක්ෂ (මුදල් ප්‍රවාහ සහ ඒකාබද්ධ අරමුදල් කළමනාකරණය) / பணிப்பாளர் (காசுப்பாய்ச்சலும், திரட்டு நிதி முகாமைத்துவமும்) / Director (Cash flows & consolidated funds management) Tele. : 2484738 E-mail : padmas@sad.gov.lk
අධ්‍යක්ෂ (ණය ගැනීම්) / பணிப்பாளர் (கடன்படல்) / Director (Borrowings) Tele : 2484739 silvah@sad.gov.lk
අධ්‍යක්ෂ (ආදායම්) / பணிப்பாளர் (வருமானம்) / Director (Revenue) Tele : 2484741 anandar@sad.gov.lk
අධ්‍යක්ෂ (ණය සේවා සහ ගිණුම්) / பணிப்பாளர் (கடன் சேவைகளும், கணக்குகளும்) / Director (Debt Servicing & Accounting) Tele. : 2484748 jayarathnak@sad.gov.lk

| | |
|---|---|
| 20.03.30.00 | විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම් |
| 20.03.90.00 | විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම් |
| 20.05.20.00 | අනෙකුත් /වර්තන පැවරුම් |
| 20.06.20.00 | ප්‍රාග්ධන ආදායම් - ප්‍රාග්ධන වත්කම් විකිණීම |
| 20.06.40.00 | ප්‍රාග්ධන ආදායම් - ණය ආපසු අයකිරීම |

ලලිත් ආර්. ද සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

පිටපත් - 01. විගණකාධිපති
02. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මහ භාණ්ඩ
දු. පෙ. 15
අධ්‍යක්ෂ ජ
பணிப்பாள
Director G
මගේ අංක
எனது இ
My No.